**අයගම ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අයගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අයගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උපචිත වියදම් රු.107,300ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2022 අවසන් ගිණුම් සැකසීමේදී එම වටිනාකම් අත්හැරී ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | කර්මාන්ත වෙනුවෙන් ණයහිමියෝ සහ ණයගැතියෝ රු.18,826,749ක් බැගින් වැඩියෙන් දැක්වුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලබන බව. | - එම - |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 06ක ශේෂ සහ උපයෝගී ලේඛන අනුව එම ශේෂ අතර රු.20,130,866ක වෙනසක් විය. | 2020 වර්ෂයට පෙර සිට පවතින වෙනස්කම් බැවින් පරීක්ෂා කිරීම ඉතාමත් අපහසු කාර්යයක් බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු.311,678ක් වූ කල් ඉකුත් වූ විවිධ තැන්පතු මුදල් රෙගුලාසි 571 (2) අනුව නිරවුල් කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම මගින් නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 08ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | මේ සඳහා නීති සහය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,455,454ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.1,627,450ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,287,560 | 1,263,910 | 1,246,874 | 581,796 | 1,097,100 | 1,059,337 | 1,025,797 | 556,210 |
| කුලී | 7,703,612 | 8,423,573 | 8,909,463 | 909,920 | 8,010,733 | 8,581,874 | 5,896,292 | 2,605,388 |
| බලපත්‍ර ගාස්තු | 517,410 | 517,390 | 482,840 | 11,000 | 363,900 | 501,714 | 440,274 | 15,850 |
| වෙනත් ආදායම් | 710,000 | 491,840 | 485,576 | 12,593 | 8,620,100 | 878,214 | 867,917 | 12,217 |
| | 10,218,582 | 10,696,713 | 11,124,753 | 1,515,309 | 18,091,833 | 11,021,139 | 8,230,280 | 3,189,665 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 03ට වඩා පැරණි රු.176,101ක් හිඟහිටි අක්කර බදු ශේෂයක් 2022 දෙසැම්බර් 31 දිනට පැවැතිණි. | ඉදිරියේදී හිඟය අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ආ) | අයගම නගරයේ බස් නැවතුම්පොළ ඉහළ මහලෙහි කඩකාමර 05ක් 2017 වර්ෂයේ සිට පොලිසිය විසින් පරිහරණය කිරීම හේතුවෙන් ආදායම් උපයා ගැනීමට නොහැකි වී තිබුණි. | හිඟ මුදලින් රු.105,000ක් අයකරගෙන ඇති බව. | ගොඩනැගිල්ල අරමුණුගත කාර්යය සඳහා යෙදවිය යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල මනු සවි නොකර 507 දෙනෙකු වෙත ජල සැපයුම් ලබා දී මාසික ස්ථාවර ගාස්තුවක් පමණක් අයකර තිබුණි. 2022 වර්ෂය සඳහා බිල්කළ ජල ගාස්තු ආදායම රු.614,100ක් වුවද, එම සේවාව සැපයීමට වැටුප් ඇතුළු පොදුකාර්ය වැය වෙනුවෙන් | සුභ සාධන කර්තව්‍යයක් ලෙස මෙම ජල ව්‍යාපෘති පවත්වාගෙන යනු ලබන බැවින් ජල මීටර සවිකිරීම මගින් වියදමට සාපේක්ෂ | ජල මනු සවිකර ගාස්තු අයකිරීම විධිමත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය තුළ රු.1,085,909ක් වැයකර තිබුණි. ජලය ලබා දීමට වැය වන වියදම හෝ පියවීමට, ජල මනු සවිකර ගාස්තු අයකිරීමට 2022 දෙසැම්බර් දක්වාම පියවර ගෙන නොතිබුණි. | ආදායමක් කරා ප්‍රායෝගිකව ලඟාවීමේ හැකියාවක් නොමැති බව. | |
| (ආ) | කෘෂි බෝග අලෙවි මධ්‍යස්ථානයේ කඩකාමර 05ක් පෙර ගෙවුම් මුදල් (Key Money) ගෙවා නිම වීමට පෙර ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව, බදුකරුවන් වෙත භාර දී තිබුණි. ඉන් කඩ කාමර 03කින් වසර 03කට වඩා පැරැණි පෙර ගෙවුම් මුදල් රු.220,000ක් අයකර නොතිබුණි. ගිවිසුම පරිදි, කඩකාමර 04ක් සඳහා වාර්ෂිකව ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 41ක් පමණ බැහැර කිරීම සඳහා කාර්යය මණ්ඩල සේවකයින් 11 දෙනෙකු හා වාහන 03ක් වෙනුවෙන් රු.37,848,367ක් පමණ වැයකර තිබුණ ද, එම අපද්‍රව්‍ය පරිසර හිතකාමීව බැහැර කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ මධ්‍යස්ථානයක් නොමැති බව. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 19(xii) වගන්තිය පරිදි විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය රහිතව 2022 වර්ෂයේ දී ඉන්ධන පිරවුම්හලක් ඉදිකිරීමට වසර 30ක් සඳහා ඉඩමක් බදු දී තිබුණි. එම ඉඩම සඳහා තක්සේරුවක් ලබාගෙන නොතිබුණු අතර හිඟහිටි බදුකුලී රු.41,332ක් ද අයකර නොතිබුණි. | යෝජිත භූමිය සභාවට පවරා දීමට අවශ්‍ය පැවරුම් සහතිකය ලද පසු හිඟ මුදල් අයකර කරන බව. | ඉඩමේ හිමිකම ලබා ගෙන හිඟ ආදායම් අයකර ගත යුතු වේ. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භූමි යෝග්‍යතා සහතිකයක් ලබා ගැනීමකින් තොරව අයගම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. පසුව අත්තිවාරම හා කුලුනු පාදම (Column Shaft) පමණක් ඉදිකර තිබියදී 2022 වර්ෂයේදී අනෝන්‍ය එකඟතාව මත ගිවිසුම අවසන් කර තිබුණ ද, නිමකළ වැඩ වෙනුවෙන් රු.2,018,645ක් වැඩිපුර ගෙවා තිබුණි. | භූමි යෝග්‍යතා සහතිකයක් ඉල්ලුම් කර ඇත. ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහලයාම නිසා අන්‍යෝන්‍ය එකඟතාව මත ගිවිසුම අවසන් කර ඇත. වැඩිපුර ගෙවීම් රැඳවුම් මගින් අය කෙරේ. | භූමි යෝග්‍යතා සහතිකයක් ලබා ගත යුතුය. එමෙන්ම වැඩිපුර ගෙවීම් ආපසු අයකළ යුතු වේ. |

**3.4 වාහන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | ------------ |
| (අ) | ට්‍රැක්ටර් හා ටේලර් 03ක හිමිකාරීත්වය, පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණි. | මෝටර් රථ පැවරුම් ලේඛණ 06ක් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2008 වර්ෂයේ දී රු.510,000කට මිල දී ගෙන තිබුණු ට්‍රැක්ටරයක් 2015 වර්ෂයේ සිට අභාවිතව පැවැතුණි. | ඉදිරියේදී ධාවන කටයුතු වලට එක් කිරීමට කටයුතු කරන බව. | අවශ්‍යතාව අනුව කටයුතු කළ යුතු වීම. |